# ස්වාධීන මැතිවරණ කොමිසමේ සංයුතිය 05 ක් විය යුතුයි - පැෆරල්

ඉන්දික හේවාවිතාරණ

දහඅට වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් අහෝසි වී ගිය ස්වාධීන මැතිවරණ කොමිසම නැවත ඇති කිරීමේදී එහි සංයුතිය සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වියයුතු බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

අලුතින් ඇති කිරීමට යන ස්වාධීන මැතිවරණ කොමිසම පිළිබඳව පැෆරල් සංවිධානය මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු විද්වතුන් සමග පසුගිය සිකුරාදා සාකච්ඡා කළ බවත්, ඒ තුළින් ලබාගත් කරුණු පදනම්ව සකස් කළ වාර්තාවක් 20 වැනි සිකුරාදා වනවිට ජනාධිපතිවරයාට, විධායක කමිටුවට සහ පාර්ලිමේන්තුවට ලබාදෙන බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මේ අනුව ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවට මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු, විශ්‍රාමික මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු සහ ගිණුම්, පරිපාලන සහ නීති අංශ නියෝජනය කරමින් එක් නිලධාරියෙකු බැගින් නිලධාරීන් පස් දෙනෙකු ඇතුළත් විය යුතු බවද ඔහු පවසා සිටියේය.

මේ පිළිබඳ අඩංගු යෝජනා මාලාව මේ සතිය තුළම අදාළ වගකිවයුතු ආයතනවලට ලබාදෙන බවද හෙතෙම සඳහන් කළේය.